# ආත්ම පරිත්‍යාගය, ආගමික ත්‍රස්තවාදය සහ ස්වදේශීය ආරක්ෂාව පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් (ඉස්ලාම් සහ ක්‍රිස්තියානි දේවධර්මීය ආගම් ආශ්‍රයෙනි)

*වලවේ තුසිතසිරි හිමි* [1]

අන්‍ය සුභ සිද්ධිය උදෙසා තම ජීවන අරමුණු, අවශ්‍යතා හෝ අභිලාෂ අතහැර දැමීම ආත්ම පරිත්‍යාගය යි. තත්කාලීන සමාජ උන්නතිය උදෙසා මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් බොහෝ ආගමික සංස්ථාවන්හි බිහිවීම සහ ස්ථාවරත්වය සිදු වූ නුමුදු  අද්‍යතනය වන විට මෙම සංකල්පය අන්තවාදීත්වයෙන් ගෙන පොදු සමාජ අවනතිය පිණිස  භාවිත වේ. ඒ ත්‍රස්තවාදී ව්‍යාපාරයන්හි අභිලාෂ පූරණය උදෙසා යොදා ගනිමින් ස්වදේශීය ආරක්ෂාවන් සඳහා ද තර්ජනයක් වෙමිනි. එහෙයින් ආත්ම පරිත්‍යාග සංකල්පය ආගමික ත්‍රස්තවාදයන් උදෙසා අභිප්‍රේරිත වන්නේ කෙලෙස ද යන ගැටලුව පාදක කොට එමඟින් සමකාලීන සමාජයට සිදුකරන බලපෑම පිළිබඳ ව ක්‍රිස්තියානි සහ ඉස්ලාම් දේවධර්මීය ආගම් ප්‍රාමාණික කොට මෙම අධ්‍යයනය සිදුකරන ලදි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයෙහි සිද්ධි අධ්‍යයන පර්යේෂණ ක්‍රමය පාදක කොට මෙම පර්යේෂණය සිදුකරන ලද අතර දත්ත සම්පාදනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත රැස් කරන ලදි. සත්‍ය ගවේෂණ සිද්ධාන්තය මත පදනම්ව කාලීන සමාජ අවශ්‍යතාව උදෙසා තම දෘෂ්ටියට අනුකූල වූ, ශුද්ධ වූ, උසස් යැයි සම්මත, පොදු යහපත පිණිස වූ අරමුණු උදෙසා ජීවිත පරිත්‍යාගයෙන් පවා කටයුතු කිරීම දේව ධර්මීය ආගම්හි ප්‍රවණතාව විය. නමුත් පශ්චාත් කාලීනව මෙම සංකල්පය ආගමෙහි නාමයෙන්  දේශපාලන බලකාමීත්වය සහ පටු අරමුණු වෙනුවෙන් යොදා ගැනීමට ලක්විය. ශුද්ධ වූ කුරාණය සහ ඉස්ලාම් ධර්ම ග්‍රන්ථවල එන ජිහාඩ්, හදීස්, කුර්බානි, ෂරියා සහ ශුද්ධ වූ බයිබලයේ පැරණි තෙස්තමේන්තුවේ එන ශුද්ධ යුද්ධය මෙන් ම එළිදරව්ව, ධාර්මිෂ්ඨ කෝපය වැනි ක්‍රිස්තියානි සංකල්ප ත්‍රස්තවාදී ව්‍යාපාරයන් විසින් තම මූලධර්ම ලෙස විකෘති කොට දක්වමින්, යුක්ති සහගත කරමින්, උත්කර්ෂයට නංවමින්, මනෝ මූලික මතවාදී දෘෂ්ටි නිර්මාණය කරමින් ආත්ම පරිත්‍යාග සංකල්පය සියදිවි නසාගැනීමේ උපාය මාර්ගික ක්‍රමවේදයක් ලෙස භාවිත කරයි. ඒ තම ජීවිතය විනාශ කරගැනීම පමණක් නොව අන්‍ය ජීවිත ද විනාශ කරන හෙවත් මරාගෙන මැරෙන ප්‍රහාර දක්වා වන මානසිකත්වයක් පුද්ගලයා තුළ නිර්මාණය කරමිනි. ජාත්‍යන්තර සාධක පසෙක තබා ශ්‍රී ලංකා රාමුව තුළ මෙම සන්දර්භය සාකච්ඡා කළ ද ඒ සඳහා වන සමීපතම උදාහරණ වන බැවින් රාජ්‍ය මැදිහත්වීම මත බුද්ධි අංශවල සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් ඔබ්බට නව්‍ය උපාය මාර්ග ක්‍රියාත්මක කරමින් සක්‍රීය කිරීම සහ සාමාන්‍ය ජනතාව මේ පිළිබඳ ව සවිඥානික කිරීම කාලීන අවශ්‍යතාවයකි.

***ප්‍රමුඛ පද:*** ආගමික ත්‍රස්තවාදය, ආත්ම පරිත්‍යාගය, දේවධර්මීය ආගම්, දේශපාලනය, ස්වදේශීය ආරක්ෂාව

[1] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. wthusihasiri23@gmail.com